සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre ... Kandelle

වර්ෂ අවසාන ඇගයීම - 2024 - (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - (2025)
Year End Evaluation - 2024 - (2025)

№ 008273

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි. |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශුද්ධ බයිබලයේ ප්‍රඥා සාහිත්‍යයට අයත් පොතක් වනුයේ,
   i. 1 මකබී ii. ප්‍රේම ගී iii. හබක්කුක් iv. 1 සාමුවෙල්

2. ශුද්ධ බයිබලයේ ගීතාවලියේ සාම්ප්‍රදායික කර්තෘ ලෙස පිළිගනු ලබන්නේ,
   i. මෝසෙස් ii. සාවුල් iii. දාවිත් iv. සලමොන්

3. ශුද්ධ වූ ජොහන් ශුභාරංචියේ සඳහන් "මම වෙමි" ප්‍රකාශ හතෙන් ප්‍රකාශවනුයේ,
   i. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේව පුත්‍රභාවය යි. iii. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුභාවය යි.
   ii. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සාංඝිකත්වය යි. iv. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය යි.

4. A - ඔහු ඊශ්‍රායල්වරුන්ගේ අවසාන විනිශ්චයකාරයා ය. B - ඔහු දිවැසිවරයෙකි.
   C - ඔහු සාවුල් හා දාවිත් රජකමට අභිෂේක කළේ ය. D - ඔහු පූජකයෙකි.
   ඉහත පාඨයන් අනුව කියවෙන ශුද්ධ බයිබලීය චරිතය වනුයේ,
   i. සාමුවෙල් ii. ගිඩියොන් iii. දෙබෝරා iv. සැම්සොන්

5. ඊශ්‍රායෙල් රාජ්‍යය එක්සේසත් කළ රජවරු වනුයේ,
   i. දාවිත්, සාවුල්, ජෙරබෝවම් iii. සාවුල්, දාවිත්, සලමොන්
   ii. සාවුල්, සලමොන්, රෙහෙබෝවම් iv. සලමොන්, ජෙරබෝවම්, රෙහෙබෝවම්

6. සුළු හා බරපතළ පාපවල විපාක පහත දැක්වේ.
   A - මරණීය පාපයෙන් ජය ගැනීමට අප තුළ ඇති ශක්තිය දුර්වල කරයි.
   B - ඉෂ්ට වරප්‍රසාද අහිමි වී නිරය හිමි වේ.
   C - අපගේ ආත්මික ජීවිතය මරණයට පත් කරයි.
   D - දෙවියන් වහන්සේ සමග මිත්‍රත්වය බිඳී යයි.
   ඉහත කරුණුවලට අනුව බරපතළ පාපවල විපාක පමණක් සඳහන් වනුයේ,
   i. A හි පමණි. iii. A හා B හි පමණි.
   ii A, D හා B හි පමණි. iv. B, C හා D හි පමණි.

7. ශුද්ධ වූ අගොස්තීනු මුනිදුන්ගේ සිත්හැරීම සඳහා බලපාන ලද සාධක වනුයේ,
   i. මවගේ බලවත් යාච්ඤාව හා මග පෙන්වීම ය.
   ii ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාගේ මග පෙන්වීම හා මවගේ බලවත් යාච්ඤාව ය.
   iii. ශුද්ධ වූ අගොස්තීනු මුනිදුන්ගේ මනස්ථාපනය හා මවගේ බලවත් යාච්ඤාව ය.
   iv. ශුද්ධ වූ අගොස්තීනු මුනිදුගේ මනස්ථාපනය හා ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාගේ මග පෙන්වීම ය.

8. දෙවියන්ගෙන් කමාව අයැද හැකි පමණ කඩිනමින් පාපෝච්චාරණය කළ යුත්තේ,

i. බරපතළ පාපයක් කළ විට
ii. සුළු පාපයක් කළ විට
iii. තම ජීවිතයට එරෙහිව පාපයක් කළ විට
iv. තම ආත්මයට එරෙහිව පාපයක් කළ විට

9. "ඔබ අතුරෙන් යමෙක් රෝගීව සිටින්නේ නම්, ඔහු සභා මූලිකයන් කැඳවාගනී වා." මෙසේ සඳහන් කර ඇත්තේ,

i. ශුද්ධ වූ මතෙව් තුමාගේ සුබාරංචියේ ය.
ii. ශුද්ධ වූ පාවුලු තුමා රෝමවරුන්ට ලියූ ලිපියේ ය.
iii. ශුද්ධ වූ පාවුලු තුමා ගලාතිවරුන්ට ලියූ ලිපියේ ය.
iv. ශුද්ධ වූ ජාකොබ් තුමා ලියූ ලිපියේ ය.

10. රෝගීන්ගේ ආලේපනය නැමති දේව ප්‍රසාද නිධානය පූජාප්‍රසාදීන් වහන්සේ දානය කරන විට ශුද්ධ වූ තෛලයෙන් ආලේප කරනුයේ,

i. රෝගියාගේ නළල, දෑත් හා පාදයන් ය.
ii. රෝගියාගේ නළල හා පාදයන් ය.
iii රෝගියාගේ නළල හා දෑත් ය.
iv. රෝගියාගේ නළල, දෑත් හා ළය පෙදෙස ය.

11. මිනිස් ජීවිතය විනාශ කිරීම වැරදි ක්‍රියාවක් වනුයේ,

i. දෙවියන් වහන්සේ පමණක් සියල්ල දන්නා නිසා ය.
ii මිනිස් ජීවිතයේ ස්වාමියාණෝ දෙවියන් වහන්සේ පමණක් වන නිසා ය.
iii. මිනිස් ජීවිතයේ අයිතිය අප සතු නිසා ය.
iv. මිනිස් ජීවිතයේ අයිතිය දෙමාපියන් සතු නිසා ය.

12. මිනිස් ජීවිතයේ අයිතිය ඇත්තේ දෙවියන් වහන්සේ ට ය. එම නිසා මිනිස් ජීවිතයේ ආරම්භය මව් කුස තුළ දරුවකු පිළිසඳ ගත් මොහොතේ සිට ම සිදු වන නිසා කතෝලිකයන් වැලකී සිටිය යුතු ක්‍රියාවක් වන්නේ,

i. කාන්තාවන්ට අපහාස කිරීමෙන් ය.
ii. තම ශරීර අවයව කෙලෙසීමෙන් ය.
iii බොරු කීමෙන් ය.
iv. ගබ්සා කිරීම හා එයට උපකාර කිරීමෙන් ය.

13. විවාහය නැමති දේව ප්‍රසාද නිධානය තුළ ස්ත්‍රිය හා පුරුෂයා යන දෙදෙනාම විවාහයේ උත්තරීතර බව ආරක්ෂා කිරීමට කැපවිය යුත්තේ,

i. විවාහයට පෙර හෝ පසු කිසිම අනිසි සම්බන්ධතාවයක් ඇති කර නොගැනීමෙන් ය.
ii විවාහය තුළ රණ්ඩු ඇති කර ගැනීමෙන් ය.
iii. දහමින් ඈත් වීමෙන් ය.
iv. නරක පත පොත කියවීමෙන් ය.

14. දාවිත් රජතුමා උරියාගේ බිරිඳ වූ බැත්ෂෙබා සමග අනියම් සබඳතාවයක් ගොඩනගා ගනිමින් . . .

i. පිරිසිදු ජීවිතයක් ගත කළේ ය.
ii. පරදාර ආලය කළේ ය.
iii. දේව හඬට සවන් දෙන ලදි.
iv. විවාහයට වටිනාකමක් දෙන ලදි.

15. "මම ස්වර්ගීය රජාණන්ගේ පුතණුවන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග විවාහ වූ වෙමි." මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,

i. ශුද්ධ වූ මරිය ගොරෙත්ති මුනිවරිය යි.
ii. ශුද්ධ වූ රීටා මුනිවරිය යි.
iii. ශුද්ධ වූ ඇග්නස් මුනිවරිය යි.
iv. ශුද්ධ වූ බාර්බරා මුනිවරිය යි.

16. දීර්ඝ නියඟයෙන් රට බේරා ගැනීමට වර්ෂාව ඉල්ලා යච්ඤා කිරීමට ශුද්ධ වූ ජුසේ වාස් මුනිඳුන්ට ආරාධනා කළේ,

i. විජය රජතුමා ය.
ii. පළමු වන පරාක්‍රමබාහු රජතුමා ය.
iii. මහසෙන් රජතුමා ය.
iv. දෙවන විමලධර්මසූරිය රජතුමා ය.

17. මෙලොව උපත ලබා ප්‍රසාද ස්නාපනය ලබන කතෝලිකයන්ට හිමිවන ජීවිත දෙකක් වනුයේ,

i. සැපවත් ජීවිතය හා සැහැල්ලු ජීවිතය යි.
ii. සැපවත් ජීවිතය හා මරණයෙන් පසු ජීවිතය යි.
iii. ලෞකික ජීවිතය හා සදාතනික ජීවිතය යි.
iv. සැහැල්ලු ජීවිතය හා අකාරුනික ජීවිතය යි.

18. ස්නාවක ජුවාම් තුමාගේ උපතින් දින 8 කට පසු කරා ශක්තිය ලැබ දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ,

i. සිමියොන් තුමා ය.
ii. මරිය තුමිය යි.
iii. පේදුරු තුමා ය.
iv. සෙකරියස් තුමා ය.

19. ධ්‍යානය යනු,

i. කතෝලික භාවනාවකි.
ii. ජේසුස් වහන්සේට කරන යාච්ඤාවකි.
iii. ජේසුස් වහන්සේ වෙත යොමු කළ විශ්වාසයේ බැල්මකි.
iv. කතෝලික සේවාවකි.

20. කුඩා කිතුනු සංසවල සුපුවත බෙදා ගැනීමේ ක්‍රමවේදය වන අසිපා ක්‍රමවේදය ආරම්භ වූයේ,

i. පස්වන ආසියාතික රදගුරු සමුළුවේදී ය.
ii ශ්‍රී ලංකා රදගුරු සමුළුවේදී ය.
iii. හය වන ආසියාතික රදගුරු සමුළුවේදී ය.
iv. පස්වන යුරෝපා රදගුරු සමුළුවේදී ය.

(ල. 20×2=40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. i. ශුද්ධ බයිබලයේ ඉතිහාස පොත් දෙකක් නම් කරන්න.
ii. නව ගිවිසුමේ ඇති පොත් බෙදෙන කොටස් දෙකක් ලියන්න.
iii. ශුද්ධ වූ ජොහන් ශුභාරංචියේ "මම වෙමි" ප්‍රකාශ දෙකක් ලියන්න.
iv. ශුද්ධ බයිබලයේ සඳහන් වීර නායකයින් දෙදෙනෙක් නම් කරන්න.
v. පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීමට අප ප්‍රගුණ කළ යුතු දෑ දෙකක් නම් කරන්න.
vi. කතෝලික භාවනාව තුළ අප සොයා යා යුතු ප්‍රධාන කරුණු දෙක සඳහන් කරන්න.
vii. රෝගීන්ගේ ආලේපය නම් දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.
viii. පාපයට ලැබෙන දඬුවම් වර්ග දෙක නම් කරන්න. (ල. 2×8=16)

02. i. දෙවි සමිඳාණන් වහන්සේ ආදම් සහ ඒව, ඒදන් උයනේ පදිංචිකර පැවරූ කාර්යයන් දෙකක් ලියන්න. (ල. 1×2=2)
ii. මුල් පාපය නිසා ආදම් ට හිමි වූ දඬුවම් තුනක් ලියන්න. (ල. 1×3=3)
iii. පාපයෙන් වැලකීමට ඔබට කළ හැකි කාර්යයන් හයක් ලියන්න. (ල. 1×6=6)

03. i. සාවුල් රජතුමා පිළිබඳ කරුණු දෙකක් ලියන්න. (ල. 1×2=2)
ii. ඊශ්‍රායෙල් දේශයේ ප්‍රථම, දෙවන හා තුන්වන රජවරුන් පිළිවෙලට නම් කරන්න. (ල. 1×3=3)
iii. දාවිත් රජුගෙන් ඔබගේ දිවියට ගතහැකි ආදර්ශයන් තුනක් විස්තර සහිතව ලියන්න. (ල. 2×3=6)

04. i. කර්ම පාපයට අයත් වන පාප වර්ග දෙක නම් කරන්න. (ල. 1×2=2)
ii. මුල් අගුණ පව් තුනක් ලියන්න. (ල. 1×3=3)
iii. පාපයෙන් සිත් හරවා ගැනීමට වරම් පතා යාච්ඤාවක් ලියන්න. (ල. 1×6=6)

05. i. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයෙන් අපට ලැබෙන වරප්‍රසාද දෙකක් ලියන්න. (ල. 1×2=2)

ii. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයෙන් සමාව ලැබීමට කළ යුතු කාර්යයන් තුනක් ලියන්න.(ල. 1×3=3)

iii. පිවිතුරු දිවියක් ගත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න. (ල. 2×3=6)

06. i. මිනිස් දිවිය සුරැකිය යුතුවන්නේ ඇයි දැයි කරුණු දෙකකින් ලියන්න. (ල. 1×2=2)

ii. මිනිස් දිවිය සුරැකීමට විරුද්ධව කරන පාපයන් තුනක් ලියන්න. (ල. 1×3=3)

iii. අන් අයගේ දිවි සුරැකීමට ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ල. 2×3=6)

07. i. නව ගිවිසුමේ සඳහන් ප්‍රශංසා ගීත දෙකකින් ලියන්න. (ල. 1×2=2)

ii. කතෝලික යච්ඤාවේ ප්‍රභේද තුන ලියන්න. (ල. 1×3=3)

iii. කුඩා කිතුනු සංසවල සුපුවත බෙදා ගැනීමේ "අසිපා" ක්‍රමවේදයේ සත්පියවර ගැන කෙටි සටහනක් ලියන්න. (ල. 6)